---

**විසර්ජන ශීර්ෂය 108 - තැපැල් සේවා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

<u>**1 කොටස**</u>

**තැපැල් සේවා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 308 | තැපැල් දෙපාර්තමේන්තුව |

02. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 8,705,989,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 8,568,197,717 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු. 114,599,436 ක සිට රු. 23,191,847 දක්වා වූ පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 38.8 සිට සියයට 0.27 ක් දක්වා පරාසයක පැවතින. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 108 | තැපැල් සේවා අමාත්‍යාංශය | 82,359,000 | 213,071,000 | 75,582,446 | 105,248,118 | 6,776,554 | 107,822,882 |
| 308 | තැපැල් දෙපාර්තමේන්තුව | 8,266,059,000 | 144,500,000 | 8,257,699,996 | 129,667,157 | 8,359,004 | 14,832,843 |
| | එකතුව | 8,348,418,000 | 357,571,000 | 8,333,282,442 | 234,915,275 | 15,135,558 | 122,655,725 |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

තැපැල් දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂයේදී ආදායම් සංකේතාංකයක් සඳහා රු. 4,600,000,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර ආදායම් ලෙස රු. 4,952,411,855 ක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 107.7 ක ආදායමක් රැස්කර තිබුණි.

| ආදායම් ගණන්දීමේ නිලධාරී | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත | තථ්‍ය | වැඩියෙන් එකතු කිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | % |
| තැපැල්පති | 20-01-02-00 | 4,600,000,000 | 4,952,411,855 | 352,411,855 | 7.7 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

#### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 108 | 10801 | 3,500,000 | 2,160,200 | 1,900,000 | 2,441,951 | 40,000,000 | 12,945,712 |
| 308 | 30801 | 600,000,000 | 572,265,376 | 480,000,000 | 593,326,906 | 1,975,000,000 | 1,682,238,522 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### (අ) අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම් වල රු. 338,352,809 ක් වූ හර ශේෂ පැවතුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය හර |
|---|---|
| | රු. |
| තැපැල් සේවා අමාත්‍යාංශය | 2,632,677 |
| තැපැල් දෙපාර්තමේන්තුව | 335,720,132 |

### (ආ) පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු. 305,371,277 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| තැපැල් සේවා අමාත්‍යාංශය | 6000/0000/0015/0022/000 | 3,825,803 |
| තැපැල් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0162/000 | 48,144,232 |
| | 6000/000/00/0015/0172/000 | 253,401,242 |

**11 කොටස**

**එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව**

1. විසර්ජන ශීර්ෂය 108 - තැපැල් සේවා අමාත්‍යාංශය

1.1 විගණන විෂය පථය

තැපැල් සේවා අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූනි 13 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත්කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත්කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත්කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව තැපැල් සේවා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය විසින් 2012 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත්කර තිබුණි.

| ශීර්ෂය/ විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 108 | විසර්ජන ගිණුම |
| 10801 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය |

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත් හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| පුද්ගල පඩිනඩි ලේඛනය | මු.රෙ. 453 හා අංක DMA/2009(1) හා 2009 ජුනි 09 දිනැති විගණන හා කළමනාකරණ චක්‍රලේඛය |
| පරිගණක උපාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

(ඇ) අයවැය විචලනය

(i) වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු. 390,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 21 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ත් සියයට 100 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

---

(ඇ) රාජ්‍ය වියදම් කළමනාකරණය

---

2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ඇස්තමේන්තුවලින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් පුනරාවර්තන හා මූලධන වියදම්වලින් පිළිවෙලින් සියයට 2 ක් හා සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතුව තිබුණු අතර අමාත්‍යාංශය විසින් එසේ ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ඉ) ඉන්ධන හා විදුලි වියදම් කළමනාකරණය

---

ඉන්ධන හා විදුලි වියදම් සඳහා අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන ඇතුලත වියදම් කළමනාකරණය කර ගත යුතු බවත්, ඒ සඳහා කිසිඳු අතිරේක මුදලක් ලබා නොදෙන බවත්, මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරු කිරීම භාණ්ඩාගාරය විසින් අනුමත නොකරන බවත් 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් උපදෙස් දී තිබුණත්, එම උපදෙස් නොතකා එම වැය විෂයයන් සඳහා භාණ්ඩාගාර අතිරේක ප්‍රතිපාදන වශයෙන් රු. 500,000 ක් සමාලෝචිත වර්ෂයේදී පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගෙන තිබුණි.

(ඊ) අග්‍රිම ගිණුම

---

2013 අප්‍රේල් 30 දින වන විට අමාත්‍යාංශය පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු. 927,297 ක් වී තිබුණි. ඉන් රු. 737,955 ක් වූ ශේෂ 2008 ජනවාරි 25 දින සිට පැවත එමින් තිබුණි.

(උ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 10801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 888,858 ක් වූ අතර, එම හිඟ හිට තිබුණු ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
------------------------------------

1.4.1 සංයුක්ත සැලැස්ම

----------------------

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

1.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

-------------------------------

ඉහත 1.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, 2012 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

1.4.3 අභ්‍යන්තර විගණනය

-------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

i. භාණ්ඩාගාරයේ විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකය අභ්‍යන්තර පාලන පද්ධති වැඩිදියුණු කිරීම සම්බන්ධ විශේෂ අවධානයක් යොමු කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

ii. ප්‍රධාන අභ්‍යන්තර විගණක භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් පත්කර තිබුණද තැපැල් සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය කළමනාකරු තනතුර සඳහාද තැපැල් සේවා අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කර තිබුණි. මෙය අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වයට අහිතකර ලෙස බලපා තිබුණි.

iii. අභ්‍යන්තර විගණන නිලධාරීන් ලෙස බඳවාගෙන තිබූ නිලධාරීන් උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරීන් වන අතර ඔවුන්ගේ දැනුම, කුසලතාවය, වගකීම හා වෘත්තීය ආචාර ධර්ම සම්බන්ධව ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීම සඳහා අභ්‍යන්තර හෝ බාහිර පුහුණු සැසිවාර පවත්වා නොතිබුණි.

1.5 වත්කම් කළමනාකරණය

(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

හිටපු අමාත්‍යවරයාට සහ ඔහුගේ කාර්යමණ්ඩලය වෙත ලබාදී තිබූ රු. 79,130 ක් වටිනා ජංගම දුරකථන 02 ක් අමාත්‍යාංශය වෙත ආපසු භාරදීමට කටයුතු කර නොතිබුණි.

1.6 අනුකූල නොවීම්

(අ) නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 1985 මැයි 10 දිනැති අංක 289 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය, 1992 අගොස්තු 19 දිනැති අංක 26/92 හා 2002 පෙබරවාරි 25 දිනැති 2002/01 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | අමාත්‍යාංශ සංචිතයේ ඇති වාහන සඳහා රාජ්‍ය ලාංඡනය හා අමාත්‍යාංශයේ නම යොදා නොතිබුණි. |
| 2010 නොවැම්බර් 22 දිනැති ගැසට් නිවේදනය | | මෙම ගැසට් නිවේදනය මගින් තැපැල් සේවා අමාත්‍යාංශය ස්ථාපිත කර ඇතත් වාහනවල ලියාපදිංචිය මෙම අමාත්‍යාංශය වෙත පවරා නොගෙන එවකට පැවති තැපැල් හා විදුලි සංදේශ හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ යන අමාත්‍යාංශවල ලේකම් නමින්ම ලියාපදිංචි සහතික පැවති වාහන 16 ක් තැපැල් සේවා අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| 2013 ජනවාරි 10 දින පැවැත්වූ අමාත්‍යමණ්ඩල රැස්වීමේදී එළඹි තීරණ | 2,201,139 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විධිමත් අනුමැතියකින් තොරව තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා අර්ධ කාලීන පදනම හා පූර්ණ කාලීන පදනම මත බඳවා ගෙන තිබූ නිලධාරීන් සඳහා ගෙවන ලද දීමනා ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 12/2007 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් ඉදිරිපත්කර තිබුණ අතර එමගින් පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ නමුත් 2013 මැයි 31 දින වනවිටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම තුලින් අරමුණු ඉටුකරගෙන නොතිබුණි.

i. අපේක්ෂිත ආදායම එකතු කිරීමට විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම
ii. නව ව්‍යාපාර කටයුතුවලින් ආදායම ඉපැයීමේ ක්‍රමඋපායක් ස්ථාපිත කිරීම
iii. තැපැල් දෙපාර්තමේන්තුව දිගින් දිගටම අලාභ ලැබීම වලක්වා ගෙන ආදායම හා වියදම් සම තත්ත්වයේ පවත්වාගෙන යාම

(ආ) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ කාර්යය නියාමන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබූ පිළියන්දල, මොරටුව හා ගල්කිස්ස තැපැල් කාර්යාලවල ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මකවීම පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

i. තෝරාගත් තැපැල් කාර්යාල 10 ක් හා මධ්‍යම තැපැල් හුවමාරුව සඳහා ලියාපදිංචි තැපෑලෙන් ලිපි යැවීමේ කටයුතු පමණක් මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කර තිබූ අතර මොරටුව විශ්ව විද්‍යාලය මගින් හඳුන්වා දීමට නියමිතව තිබූ පරිගණක මොඩියුල 17 න් වෙනත් කිසිම මෘදුකාංගයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ii. පිළියන්දල තැපැල් කාර්යාලය වෙත සපයා තිබූ පරිගණක හා ඒ ආශ්‍රිත උපකරණ සෙමින් ක්‍රියාත්මකවීම නිසා මෙම ක්‍රමය යටතේ එක් ලියාපදිංචි ලිපියක් පරිගණක පද්ධතියට ඇතුළු කිරීමට විනාඩි 07 ක පමණ කාලයක් ගතවී තිබුණි. එබැවින් ලියාපදිංචි ලිපි අඩුවෙන් ලැබෙන අවස්ථාවලදී පමණක් මෙම ක්‍රමය භාවිතා කර තිබුණි.

iii. ගල්කිස්ස තැපැල් කාර්යාලයේ නිලධාරීන් හිඟවීම නිසා ක්‍රියාත්මක කර නොතිබුණි.

iv. මොරටුව තැපැල් කාර්යාලයේ ලියාපදිංචි ලිපි කට්ටලයක් ලෙස ලැබෙන අවස්ථාවලදී හැර සෙසු අවස්ථාවලදී ක්‍රියාත්මක කර තිබුණි.

1.8 පාඩු හා හානි

----------------

තොග හානි වශයෙන් රු. 815,000 ක් වාර්ෂික විසර්ජන ගිණුමේ දක්වා ඇති වටිනාකම පොත්වලින් කපාහැරීමට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අනුමැතිය ඉල්ලා සිටියද ඒ සඳහා අනුමැතිය ලබාදී නොතිබූ අතර අමාත්‍යාංශ ලේකම් විසින් ඒ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් 3 දෙනාගෙන් සියයට 50 ක් අයකර ගැනීමට කටයුතු කල බව දන්වා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හා සභාපති ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත 2013 ජනවාරි 08 දින ලිපි මගින් වාරික අයකර තැපැල් සේවා අමාත්‍යාංශය වෙත බැරකරන මෙන් අදාල ආයතනයන් වෙත දන්වා තිබුණද 2013 අප්‍රේල් 19 දින වනවිටත් එම මුදල් අයකර ගැනීම ආරම්භකර නොතිබුණි.

1.9 අනාර්ථික ගනුදෙනු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාල මොඩියුල් 17 ක් නිර්මාණය කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබූ අතර ඒ අනුව මොරටුව විශ්ව විද්‍යාලය වෙත රු. මිලියන 49 ක් ගෙවීමට එකඟ වී තිබුණි. 2012 දෙසැම්බර් 31 දින වනවිට මෙම මුදලින් රු. 39,200,000 ක් ගෙවීම්කර තිබූ නමුත් 2013 මාර්තු 12 දින වන විටත් මෙම මෙඩියුල් 17 න් කිසිවක් තැපැල් දෙපාර්තමේන්තුව වෙත හෝ තැපැල් සේවා අමාත්‍යාංශය වෙත භාරදී නොතිබුණි. හඳුන්වා තිබූ මොඩියුල් ක්‍රියාත්මක නොවීම නිසා මෙම වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ආ) දෘඩාංග මිලදී ගැනීම සඳහා රු. 71,537,790 ක මුදලක් වැයකර තිබුණද තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතු කරගෙන ඒවා ඌණභාවිතව පැවතුණි.

---

1.10 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

-------------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදිවිය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්තය |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 11 | 01 | - |
| තෘතීයික මට්ටම | 3 | 02 | 01 | - |
| ද්විතීක මට්ටම | 52 | 43 | 09 | - |
| ප්‍රාථමික මට්ටම | 31 | 30 | - | 02 |
| වෙනත් (අනියම්) | - | 02 | - | 02 |
| තාවකාලික | - | 02 | 01 | - |
| | 98 | 90 | 12 | 04 |

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 12 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 2. විසර්ජන ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

තැපැල් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූලි 03 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත්කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත්කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව තැපැල් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඌ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.15 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

දෙපාර්තමේන්තුව විසින් 2012 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

| ශීර්ෂය/ ආදායම් සංකේතය/ විෂය අංකය | ගිණුමේ නම |
| --- | --- |
| 30801 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය |

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---------------------------------------------

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 08 කට 2013 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණු අතර, එම විමසුම් වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 23,451,103 ක් විය.

(ඇ) අයවැය විචලනය

--------------------

(i) වැය විෂයයන් 10 ක් සඳහා එකතුව රු. 150,960,000 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එකතුව රු. 135,485,262 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු. 15,474,738 ක ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ත් සියයට 20 අතර පරාසයක් ගෙන තිබුණි.

(ii) තැපැල් දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු සැකසීමේදී තාත්වික පදනමකින් තොරව කල්පිත පදනම මත ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයයන් 07 කට මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයන් වලින් රු. 33,320,000 ක මුදලක් මාරු කරගෙන තිබුණු අතර පරිපූරක ඇස්තමේන්තු මගින් වැය විෂයයන් 08 කට රු. 505,039,000 ක මුදලක් ලබාගෙන තිබුණි.

(ඈ) රාජ්‍ය වියදම් කළමනාකරණය

-----------------------------------

2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ඇස්තමේන්තුවලින් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් පුනරාවර්තන හා මූලධන වියදම්වලින් පිළිවෙලින් සියයට 2 ක් හා සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට 2 ක ප්‍රතිපාදන ඉතිරිකර නොතිබුණි.

(ඉ) ඉන්ධන හා විදුලි වියදම් කළමනාකරණය

-----------------------------------------------

ඉන්ධන හා විදුලි වියදම් සඳහා අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන ඇතුලත වියදම් කළමනාකරණය කර ගත යුතු බවත් ඒ සඳහා කිසිදු අතිරේක මුදලක් ලබා නොදෙන බවත් මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරුකිරීම භාණ්ඩාගාරය විසින් අනුමත නොකරන බවත් 2012 පෙබරවාරි 16 දිනැති අංක 156 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් උපදෙස් දී තිබුණත් එම උපදෙස් නොතකා එම විෂයයන් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් රු. 6,000,000 ක් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී මාරු කර තිබුණි.

(ඊ) පොදු තැන්පත් ගිණුම

--------------------------

වර්ෂ 02 ක් ඉක්මවූ රු. 6,857,976 ක් වූ තැන්පතු 106 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(උ) ආදායම් ගිණුම්

------------------

(I) ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී තාත්වික සංඛ්‍යා භාවිතා නොකර කල්පිත සංඛ්‍යා භාවිතා කර ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. මේ හේතුවෙන් වැය විෂයයන් 23 ක් යටතේ ඇස්තමේන්තු කළ ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 50 කට වඩා වැඩි විචලනයක් නිරීක්ෂණය විය.

(II) 2012 වර්ෂයට අදාල පෞද්ගලික මූල්‍ය ආයතනයක් සඳහා කොමිස් හිඟ ආදායම රු. 1,410,049 ක් අඩුවෙන් ගිණුමෙහි දක්වා තිබුණි.

(III) ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව රටවල් 191 ක් සමඟ තම සේවාව හුවමාරු කරගැනීම තුළින් රු. 80,370,980 ක ආදායමක් උපයා ගනු ලැබුවද රු. 109,881,152 ක මුදලක් හිඟව පැවතුණි.

(IV) තැපැල් දෙපාර්තමේන්තුව හරහා විදේශීය බැංකුවක් විසින් මුදල් හා චෙක්පත් තැන්පත් කිරීමේදී සිදුවන ගනුදෙනු සංඛ්‍යාව එම බැංකුවේ වාර්තා අනුව හා තැපැල් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව පිළිවෙලින් 74,748 ක් හා 74,491 ක් වුවද ඊට හේතුන් දෙපාර්තමේන්තුව විසින් අනාවරණය කර නොතිබුණි.

(ඌ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

(I) විෂය අංක 30801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 60,120,416 ක් වූ අතර එම හිග හිට තිබුණු ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(II) 2008 දෙසැම්බර් 31 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 142 ප්‍රකාරව 2009 ජනවාරි 01 දින සිට රජයේ සේවකයකු සඳහා ගෙවිය යුතු උපරිම ආපදා ණය ප්‍රමාණය රු. 250,000 කට සීමාකර තිබුණද එම සීමාවන් ඉක්මවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 14 දෙනෙකුට අපදා ණය ගෙවීම් කර තිබුණි.

(III) හඳුනා නොගත් ශේෂ

මහනුවර, කුරුණෑගල, හා මඩකලපුව යන දිසා ගිණුම් කාර්යාල 03 හි රු. 5,125,682 ක හිග සම්බන්ධව හිඟ ණය වලට අදාලව අවසාන වරට ණය වාරික අයකල අගය හා ණය ශේෂයන්ගේ කාලවිශ්ලේෂණය නොදැක්වීම හා අත්තිකාරම් ලේඛන අනාරක්ෂිතව පවත්වාගෙන යාම හේතුවෙන් ඵලදායී අයුරින් විගණනය කිරිමට නොහැකි විය.

(IV) අය නොවී පවතින ශේෂ

(i) වසර 05 කට වැඩි අය නොවී පවතින ණය ශේෂයන්ගේ එකතුව රු. 26,660,614 ක් විය.

(ii) වසර 05 ත් 25 ත් අතර කාල පරාසයක් තුළ දිගින් දිගටම නිරවුල් කිරීමකින් තොරව දිසා ගිණුම් කාර්යාල 11 කට අදාලව රු. 18,037,023 ක මුදලක් පැවතුණි.

## 2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වනවිටත් පිළියෙල කර නොතිබුණි.

2.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---

ඉහත 1.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු වුවත්, 2012 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම 2012 සැප්තැම්බර් 14 දින විගණකාධිපති වෙත ඉදිරිපත්කර තිබුණි.

2.4.3 අභ්‍යන්තර විගණනය

---

(අ) අභ්‍යන්තර විගණන අංශයට අනුමත විගණන නිලධාරීන් සංඛ්‍යාව 40 ක් වුවද සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 10 දෙනෙකු පමණක් මෙම අංශයට අනුයුක්ත කර තිබුණි. මේ හේතුවෙන් වර්ෂය තුළ ඵලදායී හා කාර්යක්ෂම විගණනයක් ඉටුකිරීමට නොහැකිව තිබුණි.

(ආ) විගණන වැඩසටහනේ දක්වා ඇති විස්තර අනුව පහත සඳහන් කාර්යයන් පිළිබඳව පරීක්ෂා කිරීමට සැලසුම් කරනු ලැබුවද 2012 වර්ෂය තුළදී එම කාර්යයන් සිදුකර නොතිබුණි.

i. සැලසුම්ගත පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වේද යන්න පරීක්ෂා කිරීම
ii. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි ක්‍රියාකර ඇත්ද යන්න පරීක්ෂා කිරීම
iii. හිඟ වවුචර් පරීක්ෂාව
iv. නියෝජිත සේවාවලින් එකතු කරන ආදායම ගිණුම්ගතවීම හා ප්‍රේෂණය කිරීම පරීක්ෂා කිරීම

2.5 වත්කම් කළමනාකරණය

---

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

---

i. 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල 01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවත් තැපැල් දෙපාර්තමේන්තුව යටතේ ඇති දිසා ගිණුම් කාර්යාල 05 ක් විසින් 2013 මැයි 31 දිනය වන විටත් සමීක්ෂණ වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.

ii. 2012 දෙසැම්බර් 31 දින භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව දීර්ඝ කාලයක් ගබඩා කර තිබීම, ක්‍රමානුකූලව ගබඩා කර නොතිබීම, නිකුත් කිරීමේදී නිසි ක්‍රියා පරිපාටියක් අනුගමනය නොකිරීම හා පරිපාලනය විසින් මේ පිළිබඳව නිසි ක්‍රියාමාර්ග නොගැනීම නිසා රු. 440,423 ක වටිනාකමක් සහිත මුද්දර විනාශයට පත්වී තිබුණි.

iii. මුද්‍රණ දෝෂ මත ප්‍රතික්ෂේප වූ රු. 45,919 ක් වටිනා මුද්දර තොග මුද්දර ගබඩාවේ පවතින අතර එමගින් තැපැල් දෙපාර්තමේන්තුවට සිදුවී තිබූ අලාභය ඊට වගකිව යුතු ආයතන වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

iv. භාවිතයෙන් තොරව පැවතුන මුද්දර මුද්‍රිත ලිපි ද්‍රව්‍ය හා සිහිවටන පත්‍රිකා වටිනාකම රු. 2,310,203 ක් විය.

(ආ) බේරුම් නොකල බැරකම්

------------------------------

තැපැල් දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 256,719,532 ක් විය.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ වැය විෂයය 308-1-1-2003 සඳහා ඉතිරිය රු. 948,905 ක් වුවද රු. 3,346,142 ක් සඳහා බැරකම්වලට බැඳී තිබුණි.

ii. මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාරව ඉතිරිය ඉක්මවා පුනරුත්ථාපන වියදම් සඳහා බැඳීමට ඉඩදී ඇත්තේ ගතවූ තුන් අවුරුද්ද තුළ ප්‍රතිපාදනය කරන ලද මුදල් ප්‍රමාණයේ සාමාන්‍යයෙන් සියයට 50 කට නොවැඩි වන ලෙසය. නමුත් සම්මාදම් හා දායක මුදල් සඳහා වැය විෂයය 308-1-1-1505 යටතේ වූ ඉතිරිය රු. 213,802 ක් වුවද රු. 3,480,718 ක් වැඩියෙන් බැරකම්වලට බැඳී තිබුණි.

iii. හෙළිදරව් නොකරන ලද බැරකම් වටිනාකම රු. 25,522,951 ක් විය.

2.6 අනුකූල නොවීම්

--------------------

නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (i) | <u>ආයතන සංග්‍රහය</u> | | |
| | XXIV පරිච්ඡේදයේ 4.8 ඡේදය | 609,056 | සංස්ථා මණ්ඩල සඳහා මුදාහරින විට දී ඇති මුළු ණය ශේෂයම මුදාහරින අවස්ථාවේදී අයකරගත යුතු වුවත් එක් සේවකයකුගෙන් අයවිය යුතු දේපළ ණය ශේෂය අයකරගෙන නොතිබුණි. |
| | XXIV පරිච්ඡේදයේ 4 ඡේදය | 28,538,135 | විශ්‍රාම ගිය හෝ මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර නොගැනීම |
| | V පරිච්ඡේදයේ 7.1 | | |
| (ii) | ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ | | |
| | 2010 මැයි 31 දිනැති අංක SP/SB/03/10 දරන චක්‍රලේඛය සහ ඊ රාජ්‍ය ප්‍රතිපත්තියෙහි අංක 02040203 ඡේදය | - | ඊ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව මෘදුකාංගයේ තිබිය යුතු පිරිවිතර වලට අනුකූලව නිසි ප්‍රමිතියකින් යුක්තව නිමවිය යුතු අතර ඒ සඳහා වගකීම් කාල පරිච්ඡේදයක් ගිවිසුමේ ඇතුලත් විය යුතු වුවත් මුදල් ඇණවුම් ගනුදෙනු සටහන් කිරීම යොදාගනු ලබන MOMS මෘදුකාංගයට අදාලව එසේ කර නොතිබුණි. |
| (iii) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | |
| | 2012 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 05 ඡේදය | 88,426,413 | ආදායම් අඩුවීම සම්බන්ධව උපදෙස් ලබා ගෙන ක්‍රියාකළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |
| (iv) | ජාතික අයවැය චක්‍රලේඛ | | |
| | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 | 1,214,918 | නිලධාරියකු මාරුවී ගොස් මාස 02 ක් ඇතුලත ණය ශේෂ නොපියවා ඇති විට මාසික ගිණුම් සාරාංශ මගින් අයකර ගතයුතු වුවත් එසේ කර නොතිබුණි. |

2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | අරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| තිරප්පනේ තැපැල් කාර්යාලය ඉදිකිරීම | 3,751,690 | 2011.12.19 | භූමියේ අයිතිය නිරවුල් කර නොගැනීම |

(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| සිප්පුකුලම තැපැල් කාර්යාලය ඉදිකිරීම | 6,839,655 | 2011.07.01 | 2012.01.31 | 7,339,912 | ඉදිකිරීම්වල ප්‍රමාදය |
| පේමඩුව තැපැල් කාර්යාලය ඉදිකිරීම | 8,054,630 | 2011.07.01 | 2012.01.31 | 8,783,295 | ඉදිකිරීම්වල ප්‍රමාදය |
| පදවිය පරාක්‍රමපුර උප තැපැල් කාර්යාලය ඉදිකිරීම | 6,885,597 | 2011.07.01 | 2012.01.31 | 5,549,336 | ඉදිකිරීම්වල ප්‍රමාදය |

| | | | | | |
|---|---|---|---|---|---|
| දොඹගහවෙල තැපැල් කාර්යාලය ඉදිකිරීම | 6,890,510 | 2011.07.01 | 2012.01.31 | 1,498,176 | ඉදිකිරීම්වල ප්‍රමාදය |

2.8 කාර්යසාධනය

------------------

2012 වාර්ෂික ඇස්තමේන්තු/ සංයුක්ත සැලැස්ම/ ක්‍රියාකාරී සැලසුම්වලට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වාර්ෂික ආදායම

--------------------

(i) තැපැල් දෙපාර්තමේන්තුව විසින් උපයන ලද ආදායම පසුගිය වර්ෂ 04 හා සසඳා පහත දැක්වේ.

| වර්ෂය | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| ආදායම (රු.මිලියන) | 4,952 | 4,409 | 4,572 | 4,546 |

පසුගිය වර්ෂය හා සැසඳීමේදී 2012 වර්ෂයේ ආදායම රු. මිලියන 543.5 කින් වැඩිවී තිබුණද මුද්දර වැඩිපුර මුද්‍රණය කිරීම ආදායම වැඩිවීමට හේතුවී තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ උපයන ලද ආදායම් විෂයයන් 10 ක ආදායම 2011 වර්ෂයට සාපේක්ෂව රු. 22,968,162 කින් අඩුවී තිබුණි.

(iii) දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද වාණිජ ගිණුම් තොරතුරු අනුව පසුගිය වර්ෂ 03 සඳහා වූ අලාභය අඛණ්ඩව ඉහළ ගොස් තිබුණි. විස්තර පහතින් දැක්වේ.

| වර්ෂය | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| අලාභය (රු. මිලියන) | 3,426 | 3,432 | 2,839 |

---

2.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

---

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු ගිණුම් 13 කට අදාලව නිකුත් කරන ලද නමුත් මාස 06 ඉක්මවීමෙන් පසුවද ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු. 985,674 ක වටිනාකමකින් යුත් චෙක්පත් 82 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) දිසා ගිණුම් කාර්යාලවල ජංගම ගිණුම් 05 ක තැන්පත් කළ නමුත් මාස 06 ඉක්මවීමෙන් පසුවද උපලබ්ධි නොවූ රු. 1,628,985 ක වටිනාකමින් යුතු තැන්පතු 33 ක් පැවතුණි.

(ඇ) 2012 දෙසැම්බර් මාසය සඳහා සකස් කරන ලද බැංකු ගිණුම් 04 කට අදාලව රු. 2,158,519 ක් හඳුනා නොගත් බැර වශයෙන්ද බැංකු ගිණුම් 05 කට අදාලව රු. 381,271 ක් හඳුනා නොගත් හර වශයෙන්ද පැවතුණි.

2.10 අවිධිමත් ගනුදෙනු

---

තැපැල් දෙපාර්තමේන්තුව විසින් මුදල් ඇණවුම් කළමනාකරණ පද්ධතියක් (Money Order Management) හෙවත් MOMS මෘදුකාංග නිපදවීම හා මෘදුකාංග ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර්ජාල සම්බන්ධතාවය හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු. 10,001,000 ක වියදමක් දරා තිබුණ අතර නිපදවන ලද මෘදුකාංග අදාල කාර්යය සඳහා සුදුසු පරිදි නිපදවා නොමැතිවීම හේතුවෙන් භාවිතයට ගෙන නොතිබුණි.

2.11 වංචනික ස්වරූපයේ ගනුදෙනු

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 ජනවාරි 03 දින හැව්ලොක්ටවුන් තැපැල් කාර්යාලයේ මුදල් හා මුද්දර තොග භෞතික පරීක්ෂාවේදී රු. 7,044,076 ක මුදල් හා මුද්දර ඌනතාවයක් පැවතුණි.

(ආ) මුද්දර ගබඩාවෙන් භාරගන්නා ලද මුද්දර භාරගැනීම් හා නිකුත්කිරීම් සටහන් කිරීමට යොදාගනු ලබන ලේඛනයෙහි කොළ 05 ක් ලේඛනයෙන් ඉවත් කර අස්ථානගත කර තිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන නිලධාරීන් විසින් මුද්‍රා තබා තිබූ ප්‍රශ්නගත මුද්දර තොගයක් හැව්ලොක්ටවුම තැපැල් ස්ථානාධිපති විසින් අනවසරයෙන් මුද්‍රා ඉවත්කර තැපැල් කාර්යාලයේ මුද්දර තොගයට මිශ්‍රකර තිබුණි.

2.12 පාඩු හා හානි
----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) තිරප්පනේ තැපැල් කාර්යාලය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම්කර තිබූ අත්තිකාරම් මුදල වූ රු. 750,338 න් රු. 540,213 ක් පමණක් සිප්පිකුළම තැපැල් කාර්යාලය ඉදිකිරීමේ අවසාන බිල්පතින් අයකරගෙන තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවට රු. 250,125 ක පාඩුවක් සිදුවී තිබුණි. තවද උක්ත තැපැල් කාර්යාලය ඉදිකිරීමට ලබාදුන් අත්තිකාරම් මුදල ඉදිකිරීම් සිදුනොකිරීම නිසා නැවත දෙපාර්තමේන්තුව වෙත අයකිරීමට කටයුතු නොකිරීමෙන් කොන්ත්‍රාත්කරු භාරයේ වර්ෂයකට අධික කාලයක් පැවතුණි.

(ආ) 2010 වර්ෂයේදී ගෙවීම් කරන ලද දෝෂ සහිත මුද්දර මුද්‍රිත ලිපි කවර 53,500 ක් සඳහා වූ රු. 81,828 ක අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මාලිගාවත්ත, මිනුවන්ගොඩ හා ගෙලිඔය තැපැල් කාර්යාල 03 ට අදාලව රු. 984,220 ක මුදල් ඌනතාවයක් පැවති අතර එම අලාභයන් ඊට වගකිව යුතු පුද්ගලයින්ගෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මාලිගාවත්ත තැපැල් කාර්යාලයෙහි රු. 19,920 ක මුද්දර ඌනතාවයක් පැවතුණි. එම අලාභයන් ඊට වගකිව යුතු පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ඉපලෝගම, කොළඹ දකුණ දිසා ගිණුම් කාර්යාලය, වැලිමඩ, පන්විල හා හලාවත යන තැපැල් කාර්යාල 05 ක රු. 2,662,353 ක පාඩුවක් නිරීක්ෂණය විය.

(ඊ) විවිධ පුද්ගලයින් විසින් තැපැල් දෙපාර්තමේන්තුව හරහා වෙනත් රටවලට භාණ්ඩ යැවීමේදී එම භාණ්ඩ ලැබිය යුතු පුද්ගලයාට නොලැබීම හේතුවෙන් රු. 66,145 ක් වන්දි වශයෙන් ගෙවීම්කර තිබුණි.

(උ) 2007 ජනවාරි 01 සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා 45 කදී සිදුවූ වාහන අනතුරු නිසා සිදු වූ අලාභය රු. 5,297,609 ක් විය. එම අලාභය ඊට වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හා සුනාමි ආපදාවෙන් සිදුවූ 1987 වර්ෂයේ සිට පැවත එන පාඩු හා අත්හැරීම් හේතුවෙන් කපාහැරීමට ඇති මුදල රු. 50,758,116 ක් ලෙස දක්වා තිබුණත් එම මුදල කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(එ) 2006 ජනවාරි 25 දිනැති හා අංක NPA/CEO/18 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඒ) හා 7.9.10 ඡේදය අනුව ටෙන්ඩර් ඇගයීමේදී සැමවිටම ටෙන්ඩර් කොන්දේසිවලට අනුගත වූ යොදවා ගතයුතු අඩුම මිල ගණන තෝරාගත යුතු වුවත් මධ්‍යම තැපැල් හුවමාරුවේ අධිවේගී තැපැල් අංශය නවීකරණය සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී එසේ ක්‍රියානොකර දෙවන අඩුම මිල ගණන් ඉදිරිපත්කරන ලද ආයතනයට ලංසු පිරිනැමීම හේතුවෙන් රු. 410,398 ක අලාභයක් සිදුවී තිබුණි.

2.13 අනාර්ථික ගනුදෙනු

---

2012 ලෝක තැපැල් දින ප්‍රදර්ශනය වෙනුවෙන් රු. 960,000 ක් වැය කොට අලෙවිකිරීම සඳහා මිලදී ගනු ලැබූ පැන් රඳවන 3,000 න් පැන් රඳවන 2,869 ක්ම අලෙවිනොවී ඉතිරිවීම හේතුවෙන් ඒ සඳහා වැය කරන ලද රු. 918,080 ක මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි.

2.14 කළමනාකරණ දුර්වලතා

---

(අ) විශ්ව තැපැල් සංගමය විසින් 2009 වර්ෂයේදී තැපැල් කටයුතු සංවර්ධනය කිරීම සඳහා ලබාදී තිබූ ආධාර වලින් රු. 27,255,851 ක ශේෂයක් 2012 දෙසැම්බර් 31 දිනට පැවැති අතර එම මුදල 2013 ජූනි 28 දින වනවිටත් තැපැල් සංවර්ධන කටයුතු වෙනුවෙන් යොදවා නොතිබුණි. මෙසේ ආධාර මුදල් සංවර්ධන කටයුතු වෙනුවෙන් නොයෙදීම නිසා 2011 සහ 2012 වර්ෂ සඳහා විශ්ව තැපැල් සංගමය මගින් ප්‍රදානය කරන ආධාර තැපැල් දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි.

(ආ) වසර 05 ක කාලයක් විදේශ රැකියා නිවාඩුවක් ලැබීම හේතුවෙන් සේවයෙන් ඉවත්වී ඇති නිලධාරිණියකට එම නිවාඩුවෙන් පසු 2012 පෙබරවාරි 02 දින සිට මාස 120 ක අනිවාර්යය සේවා කාලයක් සේවා කළ යුතු බවට එකඟතාවයට එළඹ තිබියදී සේවයට වාර්තා නොකිරීම නිසා අයවීමට තිබූ රු. 650,090 ක දඩ මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයට පෙර ඇමරිකාව, එංගලන්තය හා ඉන්දියාව යන රටවල් 03 කට නියෝජිත පදනම මත මුද්දර අලෙවි කිරීම සිදුකරනු ලැබුවත් එම වර්ෂයෙන් පසු නියෝජිත පදනම මත මුද්දර අලෙවි කිරීම ඉන්දියාවට පමණක් සීමා කිරීමෙන් දෙපාර්තමේන්තුවට විශාල ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) හැව්ලොක්ටවුම තැපැල් කාර්යාලයේ පවත්වා ගත යුතු මුද්දර තොගයේ වටිනාකම රු. 5,000,000 කට සීමාකර තිබුණත් 2010 නොවැම්බර් මාසයේ සිට එම සීමාව ඉක්මවා මුද්දර තොග පවත්වා ගොස් තිබුණි.

(ඉ) හැව්ලොක්ටවුම තැපැල් කාර්යාලය 2006 වර්ෂයේ සිට 2013 ජනවාරි 02 දක්වා ප්‍රාදේශීය තැපැල් අධිකාරීගේ අධීක්ෂණයට ලක්කර නොතිබුණි. තවද මෙම තැපැල් කාර්යාලයේ මුද්දර ලැබීම් පිළිබඳව ප්‍රමාදවී ගිණුම්ගත කිරීම පිළිබඳව හා ප්‍රථම දින ප්‍රේෂණ ප්‍රමාදවී ගිණුම්ගත කිරීම පිළිබඳව ගණකාධිකාරී (මුද්දර) විසින් ප්‍රාදේශීය තැපැල් අධිකාරී දැනුවත් කර තිබුණද ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඊ) ලෝක තැපැල් දිනයට සමගාමීව මුද්දර පැකට් සෑදීම සඳහා නිකුත්කර තිබූ රු. 998,725 ක් වටිනා මුද්දර තොගයෙන් මුද්දර පැකට් සාදා ගබඩාවට භාරදී තිබුනේ රු. 587,875 ක් වටිනා මුද්දර තොගය පමණක් වූ අතර රු. 410,850 ක් වටිනා මුද්දර තොග ගබඩාවට බාරදී නොතිබුණි.

(උ) තැපැල් දෙපාර්තමේන්තුව මගින් විවිධ ආයතනයන්ට නියෝජිත සේවා සපයා තිබූ නමුත් එම සේවා වෙනුවෙන් ලැබෙන ආදායම හා ඒ මත දරන වියදම් නිසි ලෙස හඳුනා ගත හැකි පරිදි වෙනම ආදායම් හා වියදම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. මේ හේතුවෙන් මෙම සේවාව තුළින් ඵලදායී ප්‍රතිලාභ දෙපාර්තමේන්තුව වෙත ලැබුනේද යන්න නිශ්වය කිරීමට නොහැකිවී තිබුණි.

(ඌ) ප්‍රාදේශීය තැපැල් අධිකාරී කාර්යාලය, දිසා ගණකාධිකාරී කාර්යාලය හා දිසා පාලන කාර්යාලය යන අංශවලින් තැපැල් දෙපාර්තමේන්තුව සමන්විත වන අතර ඒ ඒ අංශවලින් අතිකාල දීමනා වශයෙන් දරන ලද වියදම් කොපමණක්ද යන්න වෙන් වෙන් වශයෙන් හඳුනාගත හැකි වන පරිදි පොත්පත් නඩත්තු කර නොතිබුණි. ඒ අනුව නිසි අභ්‍යන්තර පාලනයකින් තොරව අතිකාල ගෙවීම් සිදුකර තිබුණි.

(එ) 2012 වර්ෂය සඳහා වූ මුදල් ඇණවුම් සැසඳීම් ප්‍රකාශය 2013 ජූනි 28 දින වනවිටත් පිළියෙල කර නොතිබුණි.

(ඒ) සිප්පිකුළම, පේමඩුව, තැපැල් කාර්යාල හා පදවිය පරාක්‍රමපුර උප තැපැල් කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු. 2,099,766 ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකිරීමට කටයුතු කර නොතිබුණි. තවද මධ්‍යම තැපැල් හුවමාරුවේ අධිවේගී තැපැල් අංශය නවීකරණය කිරීමේ කාර්යය වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු. 170,352 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.15 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 121 | 75 | 46 |
| තෘතීයික මට්ටම | 147 | 62 | 85 |
| ද්විතීක මට්ටම | 8,854 | 6,741 | 2,113 |
| ප්‍රාථමික මට්ටම | 17,659 | 16,954 | 705 |
| වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 4,788 | 4,788 | - |
| | 31,569 | 28,620 | 2,949 |